

# කතෘගෙන්

අප රටේ අද දවස නිෂ්පාදනය වන සහල් ප්‍රමාණය අපට වුවමනා තරමින් සියයට 60ක් පමණ යයි තක්සේරු කළාට වරදක් නැති බව පෙනේ. ඉතිරි සියයට 40 එනම් ටොන් ලක්ෂ 4½ට කිට්ටු ප්‍රමාණය පිටරටින් ගෙන්වීම සඳහා රුපියල් කෝටි 22ක් පමණ අපහට වර්ෂයක් පාසා වියදම් කිරීමට සිදුවේ. අප දිවයිනේ දැනට යල මහ දෙකන්නයේ වගාවන සම්පූර්ණ කුඹුරු ප්‍රමාණයෙහි වෙනසක් ඇති නොකර අඩුව තිබෙන සහල් ප්‍රමාණය නිපදවා ගැනීමේ මාර්ගය වැටී ඇත්තේ දියුණු ගොවිතැන් ක්‍රම ඔස්සේ ය.

මෙවකට ප්‍රකට දියුණු ගොවිතැන් ක්‍රම අතුරින්, ඉන්ද්‍රියවත් නොවන රසායන පෝර කුඹුරට හා ගොයමට යෙදීමෙන් පමණක් වී බුසල් 15ක වැඩි අස්වැන්නක් එක් අක්කරයකින් ලැබෙන බව පරීක්ෂණවලින් පෙන්නුම් කෙරේ. රසායන පෝර භාවිතය සමඟ අනෙකුත් දියුණු ක්‍රමයන්ද හොඳාකාරව අනුගමනය කරන්නේ නම් එයින් ලැබෙන ප්‍රතිඵල ඇත්ත වශයෙන්ම විශිෂ්ඨ බව නිසැකයෙන් සඳහන් කළ හැකිවේ. ඉහතින් සඳහන් බුසල් 15වේ වැඩි අස්වැන්න ලබා ගැනීම සඳහා වැය වන පෝර ප්‍රමාණයේ මිල සහනාධාර ක්‍රමයට රුපියල් 24/-ටත් 30/-ටත් අතර ගණනකි. ලැබෙන වැඩි අස්වැන්නේ වටිනාකම රුපියල් 180/-ක් හෙයින් පෝර යෙදීමේ ක්‍රියාවෙන් අක්කරයකින් රුපියල් 150/-ක් හෝ ඊට වැඩි ලාභයක් සිදු කෙරේ.

වී ගොවීන් හට රජයෙන් සැපයෙන රසායන පෝර සියල්ල නිකුත් කරනුයේ සහනාධාර ක්‍රමයටයි. අත්පිට මුදලට පෝර ගන්නා ගොවීන් සියලු දෙන, පෝර ලබා ගැනීම සඳහා ගෙවිය යුත්තේ ඒවායේ වටිනාකමින් සියයට පනහක් පමණය. ඒ අතර සමුපකාර සමිතිවල සාමාජිකයින් වන ගොවීන්ට ඔවුන්ගේ පෝර සියයට 33⅓ක සහනාධාරය ඇතිව ණයට ලබා ගත හැකිය.

උසස් අස්වනු ලැබෙන පරිදි වී වගා කිරීමේදී, රසායන පෝර භාවිතය කිරීමේ වැදගත්කම දන්නා රජය එම පෝර ඉතා පහසු මිළකට ගොවීන් හට සැපයීමට පමණක් නොව එය ගොවීන්ට ලෙහෙසියෙන් ලබා ගත හැකි ස්ථානවල ගබඩා කිරීමටද විධිවිධාන යොද තිබෙන්නේය. කොළඹ හැර අද දවස ප්‍රාදේශීය පෙදෙස්වල දිස්ත්‍රික්කු ගබඩා ගණනාවක්ම පිහිටුවා තිබෙයි. දැනට පිහිටුවා ඇති දිස්ත්‍රික්කු පෝර ගබඩා 32ට අතිරේක වශයෙන් අළුත් ගබඩා 20ක් මෙම වර්ෂය තුළදී ඉදි කෙරෙන අතර මීළඟ මුදල් වර්ෂයේදී තවත් ගබඩා 22ක් ගොඩනැංවීමට කටයුතු සලස්වා ඇත. ගබඩාවේ සිට කුඹුරට පෝර ගෙන යැමේදී රැස්කිරීම හා ප්‍රවාහනය සඳහා සිදුවන හිරිහැර හැකිතාක් අඩුකරලීමේ අදහසින් අවසානයේදී සෑම කුඹුරු අක්කර 10,000 වෙනුවෙන් වෙනම ගබඩාවක් සැපයීමට රජය අදහස් කර තිබේ.

වැඩි අස්වනු සඳහා රසායන පෝර යෙදීමේ වටිනාකම අප ග්‍රාමීය ගොවීන් ක්‍රමයෙන් උගෙනීමේ ප්‍රතිඵලයක් වශයෙන් හා පෝර සැපයීමේ පහසුකම් වැඩි දියුණු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ද දිවයිනේ වී පෝර පාවිච්චිය වර්ෂයෙන් වර්ෂයට දියුණු වන්නේය. 1955/56 දී කුඹුරුවලට යොදන ලද රසායන පෝර ටොන් 12,900, 1958/59 දී ටොන් 27,000 දක්වා හා 1961/62 දී ටොන් 38,075 දක්වාද ඉහළ ගොස් ඇති හෙයින් වාර්ෂික පෝර පාවිච්චිය වැඩි වන බව හොඳා කාරව පෙනී යයි.

කුඹුරුවලට රසායන පෝර යෙදීමේ වටිනාකම, පෝර භාවිතය කරන ක්‍රම, පෝර සපයා ගන්නා අයුරු ආදිය හොඳාකාරව වටහා ගැනීම සඳහා ''වී නිෂ්පා දනය උසස් කර ගැනීම සඳහා රසායන පෝර භාවිතය'' යන මාතෘකාවෙන් ලියා ඇති ලිපිය පාඨකයාගේ සැලකිල්ලට යොමු කරවීමට කැමැත්තෙමු.